පරිවාස හා ළමාරක්ෂක සේවාදෙපාර්තමේන්තුව - බස්නාහිර පළාත
நன்னடத்தை சிறுவர் பராமரிப்புசேவைத் திணைக்களம் - மேல் மாகாணம்
Department of Probation & Child Care Services -Western Province

204,8වන මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල. 204, 8 ஆம் மாடி, டென்சில் கொப்பேகடுவ வீதி, பத்தரமுல்ல. 204,8th Floor, DencilKobbekaduwaMawatha, Battaramulla

| | | |
|---|---|---|
| මගේ අංකය / என் எண்: / My Number: WP/PCD/SER/02/F1/13/1 | ඔබේ අංකය / உங்கள் எண்: / Your Number: | දිනය / தேதி / Date: 2024.08.12 |

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක - 2024/01

සහකාර කොමසාරිස්

පරිපාලන නිළධාරි

මූලස්ථාන පරිවාස නිලධාරීන්

සියලු ම ස්ථානභාර පරිවාස නිලධාරීන්

පරිවාස නිලධාරීන්

<u>දරුවන් දරුකමට හදා ගැනීමට (කුලවැද්දීමට) සුදුසු ඉල්ලුම්කරුවන් ලියාපදිංචි කිරීම හා ලියාපදිංචි වූ ඉල්ලුම්කරුවන්ට දරුවන් වෙන් කිරීම.</u>

බස්නාහිර පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්හි හා ප්‍රජාපති රජයේ භාර ගැනීමේ මධ්‍යස්ථානයේ සිටින දරුවන් දරුකමට හදා ගැනීමට දීමේදී මෙම චක්‍රලේඛයේ සඳහන් උපදෙස් අනුව කටයුතු කළ යුතු ය. මේ සම්බන්ධයෙන් මීට ඉහත දී නිකුත් කර ඇති සියලුම චක්‍රලේඛ මින් අවලංගු කරන අතර 2024.08.15 දින සිට මෙම චක්‍රලේඛය බලපැවැත්වේ. බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 2017/5 අනුව ලියාපදිංචි කර ගන්නා ලද බලපත්‍රලාභීන් වෙත මෙම චක්‍රලේඛයේ විධිවිධාන සපුරාලීමට අවශ්‍ය සියළු කටයුතු මෙම චක්‍රලේඛය බලපැවැත්වෙන දින සිට මසක් තුළ සම්පූර්ණ කිරීමට ක්‍රියා කළ යුතු ය.

02.බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවෙන් දරුවෙකු දරුකමට හදා ගැනීම සඳහා අපේක්ෂා කරන සියලු ම ඉල්ලුම්කරුවන් මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු ය. මෙසේ ලියාපදිංචි වූ සියල්ලන්ටම දරුවන් දරුකමට හදාගැනීමට දීමට දෙපාර්තමේන්තුව බැඳී නොමැත.



CamScanner

03. ලියාපදිංචිය සඳහා අවශ්‍ය සුදුසුකම්

3.1 වසර 05 කට නොඅඩු කාලයක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන් වීම.

3.2 නීත්‍යානුකූලව විවාහ වී සිටීම.

3.3 ඉල්ලුම්කාර අඹුසැමි දෙදෙනාගෙන් අඩු වයස් තැනැත්තාගේ වයස අවුරුදු 60 ඉක්මවා නොතිබීම.

3.4 ඉල්ලුම්කරුවන්ට ස්වභාවික දරු උපතක් ලබා ගැනීමට ඇති නොහැකියාව.

3.5 ඉල්ලුම්කරුවන්ට හිමි ස්ථිර නිවසක් තිබීම.

3.6 ඉල්ලුම්කරුවන් යහපත් කායික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

3.7 ඉල්ලුම්කරුවන්ගෙන් එක් අයකු හෝ දෙදෙනාම හෝ ළමා අපයෝජනයක් සම්බන්ධයෙන් සහ වෙනත් බරපතල වරදකට අධිකරණය හමුවේ වරදකරුවන් නොවීම.

3.8 මනා ආර්ථික ශක්තියකින් යුක්ත වීම.

3.9 යෝග්‍ය අධ්‍යාපන මට්ටමක් ඉල්ලුම්කරුවන් සතුව තිබීම.

3.10 ඉල්ලුම්කරුවන් දෙදෙනා අතර යහපත් සම්බන්ධතාවයක් තිබීම.

04. ඉහත කරුණු සනාථ කිරීම සඳහා ඉල්ලුම්කරුවන් ඉදිරිපත් කළ යුතු ලේඛන

(මෙම ලේඛනවල පිටපත් ස්ථානභාර පරිවාස නිලධාරී/විමර්ශනය සිදු කරන පරිවාස නිලධාරී හා ඉල්ලුම්කරුවකු විසින් සත්‍ය ඡායා පිටපත් බවට සහතික කර තිබිය යුතු ය.)

4.1 ග්‍රාම නිලධාරී විසින් නිල ආකෘතිය අනුව නිකුත් කරන ලද ඉල්ලුම්කරුවන්ගේ පදිංචි සහතික.

4.2 ඉල්ලුම්කරුවන්ගේ උප්පැන්න සහතික.

4.3 ජාතික හැඳුනුම්පත් පිටපත්.

4.4 විවාහ සහතිකයේ පිටපතක්.

4.5 ප්‍රසව හා නාරි වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකය. ( විවාහ වී අවුරුදු 5ක් සම්පූර්ණ කර නොමැති ඉල්ලුම්කරුවන් සඳහා පමණි.)

4.6 දරුවන් හදා වඩා ගැනීමට මානසික යෝග්‍යතාව පිළිබඳ මනෝ වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් වෛද්‍ය වාර්තාවක්.

4.7 ඉල්ලුම්කරුවන් පිළිබඳ පොලිස් වාර්තා.

4.8 දේපල අයිතිය තහවුරු කිරීමට අදාළ ලේඛන.

4.9 ආදායම තහවුරු කිරීමට අදාළ ලේඛන.

(මාසික වේතන ලබන්නෙකු නම් ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද අවසාන වරට ලබාගත් වැටුප් වාර්තාවක්, ව්‍යාපාර කටයුතු කරන්නේ නම් එහි ආදායම සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් නිකුත් කළ ආදායම් සහතික හෝ පිළිගත හැකි වෙනත් අදාළ ලේඛන.)

4.10 අධ්‍යාපන මට්ටම තහවුරු කර ගැනීම සඳහා සහතික. (අධ්‍යාපන සහතික ඉදිරිපත් කිරීමට නොහැකි නම් විමර්ශනය කරන පරිවාස නිලධාරීගේ නිර්දේශ සඳහන් කළ යුතු ය.)

4.11 දරුවන් සම්බන්ධ කාරණාවල දී දායකත්වය ලබා දුන් ආකාරය දැක්වෙන ලිපි ලේඛන.



CamScanner
CamScanner

05. ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම

දෙපාර්තමේන්තුව භාරයේ සිටින දරුවන් දරුකමට හදා ගැනීමට ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන ඉල්ලුම්කරුවන් තම අත්සන් සහිත ඉල්ලීම් ලිපියක්, දෙදෙනාගේ 4R ප්‍රමාණයේ සම්පූර්ණ ඡායාරූපයක්, ඉහත 04 හි සඳහන් ලේඛනවල ඡායා පිටපත් තම ස්ථිර පදිංචියට අදාළ පරිවාස කාර්යාලයේ ස්ථානභාර පරිවාස නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතු ය.

06. විමර්ශනය හා නිර්දේශ ඉදිරිපත් කිරීම

6.1 විධිමත්ව ලැබෙන ඉල්ලීම සම්බන්ධයෙන් සති 02 ක් ඇතුළත අදාළ විමර්ශනය පවරනු ලබන පරිවාස නිලධාරි විසින් විමර්ශනය කර, සහතික කරන ලද ලේඛන සමඟ හදාවඩා ගැනීම් විමසීම් ආකෘති පත්‍රය (ඇමුණුම 01) සම්පූර්ණ කර ස්ථානභාර පරිවාස නිලධාරීගේ නිර්දේශය සහිතව බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු ය.

6.2 ලියාපදිංචිය සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම අත්‍යවශ්‍ය වන අතර එම සුදුසුකම් සපුරා ඇති බවට ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති ලේඛන විමර්ශනය කරනු ලබන පරිවාස නිලධාරි විසින් තහවුරු කර පරීක්ෂණයට ලක් කරන ලද බවට ලේඛනවල සටහන් තැබිය යුතු ය.

07. බලපත්‍රය නිකුත් කිරීම හා පොරොත්තු ලේඛනයට නම ඇතුලත් කිරීම.

7.1 ස්ථානභාර පරිවාස නිලධාරි විසින් ඉල්ලුම්කරුවන් සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන යෝග්‍යතා වාර්තාව සහ ඊට අදාළ ලේඛන බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් විසින් බලය පවරන ලද මාණ්ඩලික නිලධාරි විසින් පරීක්ෂා කර ඉල්ලුම්කරුවන්ගේ සුදුසුකම් සනාථ වන්නේ නම් දරුවෙකු දරුකමට හදා ගැනීම සඳහා ඉල්ලුම්කරුවන්ට බලපත්‍රයක් ලබා දීමට නිර්දේශ කළ යුතු ය. එම නිර්දේශය අනුව බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් විසින් එම යුවල සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබේ. මෙසේ නිකුත් කරනු ලබන බලපත්‍රය වසර 02ක් සඳහා වලංගු වේ.

7.2 මෙම චක්‍රලේඛයේ 12.6 අනුව ඉල්ලුම්කරුවන් වෙත දරුවන් වෙන් කිරීම ඉල්ලුම්කරුවන්ගේ වයස් අනුව සිදුකළ යුතු අතර ඒ බව බලපත්‍රලාභින් වෙත දැනුම් දිය යුතු ය.

7.3 ඉල්ලුම්කරුවන් වෙත බලපත්‍රය නිකුත්කර මසක් තුළ කුලවැද්දූම් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා එම සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු මත පදනම්ව බලපත්‍රලාභී ඉල්ලුම්කරුවන්ගේ නම් පොරොත්තු ලේඛනයට ඇතුලත් කිරීම කළ යුතු ය. (කුලවැද්දූම් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා එහි කාර්යභාරය මෙම චක්‍රලේඛයෙහි 13 වගන්තිය යටතේ දක්වා ඇති අතර බලපත්‍රලාභී ඉල්ලුම්කරුවන්ට දැනුම් දෙන දිනයේදී නියමිත වේලාවට අදාළ ලිපි ලේඛන සමඟ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය.)

7.4 බලපත්‍ර නිකුත් කිරීමේ ලේඛනයක් (ඇමුණුම 02) සහ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු අනුපිළිවෙළ මත පදනම්ව සකසාගත් බලපත්‍රලාභී ඉල්ලුම්කරුවන්ගේ විධිමත් වූ කුලවැද්දූම්



CamScanner

පොරොත්තු ලේඛනයක් (ඇමුණුම 03) දෙපාර්තමේන්තු මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ විෂයභාර නිලධාරී විසින් වෙන වෙනම යාවත්කාලීන කර පවත්වා ගෙන යා යුතු ය.

**08. බලපත්‍රයේ වලංගු කාලය දීර්ඝ කිරීම**

8.1 බලපත්‍රයේ වලංගු කාලය නිමවීමට මසකට පෙර ඉල්ලීම් ලිපියක් සමඟ බලපත්‍රය සෘජුවම බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් හෝ ලියාපදිංචි තැපැල මගින් බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම මඟින් බලපත්‍රයේ වලංගු කාලය වසරකින් දීර්ඝ කරගත හැකි ය. බලපත්‍රය වාර්ෂිකව දීර්ඝ කරවා ගැනීම හා වලංගු වන පරිදි තබා ගැනීම ලියාපදිංචිවූවන්ගේ වගකීමකි.

8.2 බලපත්‍රය නිකුත් කර වසර 05 කට පසුව කෙරෙන දීර්ඝ කිරීම් සම්බන්ධව ඉල්ලුම් කිරීමේ දී නැවත අදාළ පරිවාස නිලධාරී මගින් විමර්ශන වාර්තාවක් ලබා ගැනීමෙන් අනතුරුව මුල් බලපත්‍ර ලබාදුන් ක්‍රියාවලිය අනුගමනය කරමින් බලපත්‍රයේ කාලය දීර්ඝ කිරීම සිදු කරනු ලැබේ.

8.3 බලපත්‍රය අස්ථාන ගත වුවහොත් දිවුරුම් පෙත්සමක් මඟින් එය තහවුරු කර ලිඛිත ඉල්ලීමක් සිදු කිරීමෙන් පසුව මුල් බලපත්‍රයේ සහතික කළ පිටපතක් නිකුත් කරනු ලැබේ.

**09. බලපත්‍රය අවලංගු කිරීම**

9.1 බලපත්‍රයේ වලංගු කාලය නිම වී මාස 03 ක කාලයක් තුළ බලපත්‍රයේ කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු කර නොගැනීම.

9.2 දෙපාර්තමේන්තුවෙන් බලපත්‍රලාභී ඉල්ලුම්කරුවන් වෙත වෙන්කරන ලද දරුවා ඔවුන් විසින් සාධාරණ හේතුවක් රහිතව ප්‍රතික්ෂේප කිරීම.

9.3 බලපත්‍රලාභීන් පෞද්ගලිකව දරුවකු නීත්‍යානුකූලව හදා ගෙන තිබීම.

9.4 බලපත්‍රලාභීන් හට තමන්ගේම දරුවකු ලැබීම.

9.5 බලපත්‍රලාභී අඹුසැමි දෙදෙනාගෙන් එක් අයෙකු හෝ සාපරාධී වරදකට වරදකරු වීම.

9.6 බලපත්‍රලාභීන් යහපත් විවාහ ජීවිතයක් ගත නොකරන බව අනාවරණය වීම.

9.7 බලපත්‍රලාභීන්ගෙන් එක් අයෙකු හෝ මිය යාම/ පූර්ණ අබාධිත තත්වයට පත් වීම.

9.8 බලපත්‍රලාභී අඹුසැමි දෙදෙනාගෙන් එක් අයකු විසින් හෝ බලපත්‍රය අවලංගු කර දෙන ලෙස ඉල්ලීම.

9.9 බලපත්‍රලාභී යුවලට දරුවෙකු හදා වඩා ගැනීමට සුදුසු ආර්ථික ශක්තියක් නොමැති බව අනාවරණය වීම.

9.10 ඉල්ලුම්කාර අඹුසැමි දෙදෙනා වයස අවුරුදු 60 ඉක්මවා තිබීම.

9.11 ඉහත කරුණුවලට අමතරව බලපත්‍රලාභීන් හට දරුවන් හදා වඩා ගැනීමට දීමට නුසුදුසු බව ස්ථානභාර පරිවාස නිලධාරී විසින් වාර්තා කිරීම හෝ බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් වෙත වාර්තා වීම.



CamScanner

10. හදාවඩා ගැනීමට දීමට සුදුසු දරුවන්

10.1 අධිකරණය විසින් දරුවාගේ සුබසාධනය සඳහා සුදුසු කටයුතු කිරීමට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට පවරන ලද දරුවන්.

10.2 සෘජුවම දෙමව්පියන්/ මව්වරුන්/ පියවරුන්/ නීත්‍යානුකූල භාරකරුවන් විසින් බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත භාර දෙන දරුවන්.

10.3 සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකගේ 1336 අංකිත පත්‍රය යටතේ බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත භාර දෙන දරුවන්.

10.4 බස්නාහිර පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ළමා සංවර්ධන මධ්‍යස්ථානවල හා රජයේ භාර ගැනීමේ ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නේවාසික රැකවරණය ලබන ළමුන් සම්බන්ධයෙන් ස්ථාපන කමිටුව මඟින් හදා ගැනීමට දීමට සුදුසු යැයි නිර්දේශ කර ඇති බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් විසින් අනුමත කර ඇති දරුවන්.

මෙසේ නිර්දේශිත ළමුන් බලපත්‍රලාභීන් හැර වෙනත් කිසිදු පුද්ගලයෙකුට වෙන් කිරීම සිදුකරනු නොලැබේ.

11. ස්ථාපන කමිටු

ස්ථාපන කමිටුවේ සංයුතිය, බලතල හා ක්‍රියාකාරකම් 2008 අංක 1 දරණ ළමා සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ ප්‍රඥප්තියේ අංක vii වන කොටසේ 55 වගන්තියේ අර්ථ නිරූපනය අනුව සිදුකළ යුතු ය.

12. බලපත්‍රලාභී ඉල්ලුම්කරුවන්ට දරුවකු වෙන්කිරීම

12.1 කුලවද්දා ගැනීමට ලබාදිය හැකි සුදුසු දරුවෙකු හඳුනාගැනීමෙන් පසු කුලවැද්දුම් පොරොත්තු ලේඛනයේ සිටින 12.6 හි සඳහන් පරිදි සුදුසු ඉල්ලුම්කාර යුවල වෙත ඒ බව දැනුම් දිය යුතු ය.

12.2 කුලවැද්දීමට සුදුසු දරුවන් කිහිපදෙනෙකු සිටින අවස්ථාවල දී කුලවැද්දුම් පොරොත්තු ලේඛනයේ සුදුසු ඉල්ලුම්කරුවන්ගේ කැමැත්තේ අනුපිළිවෙළ විමසීමට කටයුතු කළ හැකි ය.

12.3 එසේ දැනුම් දුන් පසු අදාළ දරුවා/ දරුවන් නේවාසික රැකවරණය ලබන ළමා සංවර්ධන මධ්‍යස්ථානයන්ට ගොස් දැක බලා ගැනීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.

12.4 ඉල්ලුම්කරුවන්ට අවශ්‍ය වන්නේනම්, දරුවා වෛද්‍ය පරීක්ෂණයකට යොමු කළ හැකි අතර ඒ සඳහා බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්ගේ ලිඛිත අනුමැතිය ලබා ගත යුතු ය.

12.5 දරුවා දැක බලා ගැනීමෙන් අනතුරුව ඉල්ලුම්කාර යුවල විසින් දරුවා කුලවද්දා ගැනීමට ඇති කැමැත්ත පිළිබඳව බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් විසින් ඉල්ලුම්කරුවන් වෙත යොමු කළ දැනුම්දීමේ ලිපියේ සඳහන් දිනට පෙර බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් වෙත ලිඛිතව ලියාපදිංචි තැපැල මගින් දැනුම් දිය



CamScanner

යුතු ය. එසේ නොමැතිනම් බස්නාහිර පළාත් පරිවාසහා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත සෘජුවම ගෙනවිත් භාර දිය යුතු ය. එම ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ දේශීය කුලවද්දා ගැනීම ලෙස සදහන් කළ යුතු ය.

12.5.1 ඉහතඅංක 12.1 සහ 12.3 පරිදි දරුවකු/ දරුවන් දැක බලා ගැනීමට අවසර ලබා දුන් ඉල්ලුම්කරුවන්ගේ නම් පොරොත්තු ලේඛනයට ඇතුලත්ව ඇති කාලසීමාව මාස තුනකට වඩා වැඩි නම්, නැවත කුලවැද්දුම් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට අදාල ඉල්ලුම්කරුවන් පෙනී සිටිය යුතු වන අතර එහි නිර්දේශ මත පදනම්ව දරුවකු කුලවැද්දීම සම්බන්ධව ඉදිරි පියවර ගත යුතු ය.

12.6 දරුවකු වෙන් කරනු ලබන්නේ ඉල්ලුම්කරුවන්ගේ වයස අනුව පහත පරිදි ය.

| | අඹු සැමි දෙදෙනාගෙන් වයස අඩු තැනැත්තාගේ වයස | ඉල්ලුම් කළ හැකි දරුවන්ගේ වයස |
|---|---|---|
| 1 | අවුරුදු 25 – 45 | ඕනෑම වයසක දරුවකු |
| 2 | අවුරුදු 46 – 50 | අවුරුදු 1 ට වැඩි දරුවකු |
| 3 | අවුරුදු 51 – 55 | අවුරුදු 5 ට වැඩි දරුවෙකු |
| 4 | අවුරුදු 56 – 60 | අවුරුදු 8ට වැඩි දරුවෙකු |

12.6. I සුදුසු ඉල්ලුම්කරුවන් නොමැති වූ විට ඉහත වගුවේ සදහන් වයස් සීමාව නොතකා දරුවා ඉල්ලුම්කරුවන්ට ලබා දීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට සලකා බැලිය හැකි ය.

12.6. II තවද දරුවන්ගේඋපරිම සුබසිද්ධිය සැලසීමට අදාළ වන සුවිශේෂී සාධාරණ හේතු පවතින අවස්ථාවලදී වඩාත්ගැළපෙන බලපත්‍රලාභී ඉල්ලුම්කරුවන් වෙත දරුවෙකු ලබා දීම පිළිබඳව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට සලකා බැලිය හැකි ය.

12.7 දරුවකු වෙන් වූ බලපත්‍රලාභී ඉල්ලුම්කාර යුවල වෙත දරුවකු වෙන් කරන ලද බව දැනුම් දීමෙන් මාසයක් ඇතුළත කුලවැද්දුම් ආඥා පනත ප්‍රකාරව අදාළ දිසා අධිකරණයක නඩු පැවරිය යුතු ය. කුලවැද්දුම් නඩුව පැවරූ අධිකරණය හා නඩු අංකය ද සමඟ බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය. මෙම නඩු පැවරීමේ කාලය දීර්ඝ කර ගැනීමට සාධාරණ හේතුවක් ඇත්නම් බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා වෙත ලිඛිතව දැනුම් දීම කළ යුතු ය.



CamScanner

12.8 නඩු පැවරීමට දැනුම් දෙන ලද ඉල්ලුම්කාර යුවලට දරුවා අවශ්‍ය නොවේ නම් ඒ බව ලිපිය ලැබී සතියක් තුළ බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාට ලිඛිතව දැනුම් දිය යුතු ය.

## 13. කුලවැද්දූම් සම්මුඛ පරීක්ෂණය හා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය

13.1 බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් විසින් වාර්ෂිකව පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් බලපත්‍රලාභී ඉල්ලුම්කරුවන් වෙත දරුවන් වෙන් කර දීම සඳහා සම්මුඛ පරීක්ෂණයට භාජනය කර පොරොත්තු ලේඛන ගත කරනු ලැබේ.

13.2 මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් හෝ කොමසාරිස් විසින් නම් කරන ලද ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියෙකුගේ සභාපතිත්වයෙන් යුතු මාණ්ඩලික නිලධාරීන් පස්දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

13.3 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් බලපත්‍රලාභී ඉල්ලුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනයකර ඇමුණුම 04 හි සඳහන් නිර්ණායක අනුව ලකුණු ලබා දිය යුතු ය.

13.4 සම්මුඛ පරීක්ෂණයේ දී බලපත්‍රලාභී ඉල්ලුම්කරුවන් ලබාගත් ලකුණු අනුපිළිවෙල අනුව ලේඛනගත කර, පොරොත්තු ලේඛනයට නම් ඇතුලත් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා වෙත අනුමැතිය සඳහා නිර්දේශිත ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

13.5 මෙහිදී ලකුණු ලබාගත් බලපත්‍රලාභී ඉල්ලුම්කරුවන්ගේ නම හා ලකුණු ප්‍රතිඵල ලේඛනයේ පැහැදිලිව සඳහන් කළ යුතු ය.

13.6 ඉල්ලුම්කාර යුවලවල් කිප දෙනෙකු සමාන ලකුණු ලබා ඇත්නම් බලපත්‍රයේ කාල සීමාව සලකා බැලිය යුතු ය.

13.7 **12.5.1** අනුව කුලවැද්දූම් පොරොත්තු ලේඛනයේ මාස 03 ට වැඩි කාලයක් නම් ඇතුළත්ව ඇති ඉල්ලුම්කරුවන් යම් හෙයකින් දරුවා වෙන් කිරීමට නුසුදුසු තත්වයකට පත්වී තිබේ ද යන බව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පරීක්ෂා කිරීම කළ යුතු ය.

13.8 **12.6.1** හෝ **12.6.2** යටතේ සලකා බලනු ලබන අවස්ථාවලදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් අදාල බලපත්‍රලාභී ඉල්ලුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනයකර නිර්දේශ ඉදිරිපත් කළ යුතු ය.



CamScanner
CamScanner

14. දරුවෙකු කුලවැද්දීම සම්බන්ධව අධිකරණ ක්‍රියාවලිය වෙත යොමු වීමට පෙර හෝ අධිකරණ නියෝග ලබා දීමට පෙර හෝ අයදුම්කරුවන් කුමන අයුරින් හෝ නුසුදුසු බව අනාවරණය වුවහොත් හෝ දරුවාගේ ස්වභාවික මව/පියා/මවපියන්/නිත්‍යානුකූලභාරකරුවන් විසින් දරුවා ඉල්ලා සිටියහොත් දරුවා නැවත ලබා ගෙන කුලවැද්දීමට වෙන් කිරීම අවලංගු කිරීමේ අයිතිය බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් සතුවේ.

15. දරුවන් දරුකමට හදා ගැනීමට දීමේ දී දරුවාගේ උපරිම යහපත සුබසාධනය හා අනාගත සුරක්ෂිතභාවය සැලසෙන පරිදි ක්‍රියා කිරීමට සියලු නිලධාරින් වගබලා ගත යුතු ය.

පේෂලා ආර්. අබේසූරිය
කොමසාරිස්
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත
දුරකථන අංකය -: 011-2092710
ෆැක්ස් -: 011-2092709
ඊමේල් ලිපිනය -: probationdepartmentwp@yahoo.com

පිටපත්:

1. ප්‍රධාන ලේකම් (බස්නාහිර පළාත)

2. ලේකම් - සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා කාන්තා කටයුතු සහ සහා කටයුතු අමාත්‍යාංශය (බස්නාහිර පළාත)



CS CamScanner

ඇමුණුම 01

# දරුවෙකු හදා වඩා ගැනීමට ඉල්ලීම් කළ යුවළගේ යෝග්‍යතා වාර්තාව

වාර්තා අංකය : ...............................

01. ඉල්ලුම්කරුවන්ගේ සාමාන්‍ය තොරතුරු

| | | පිරිමි | ගැහැණු |
|---|---|---|---|
| 1. | සම්පූර්ණ නම | | |
| 2. | ලිපිනය | | |
| 3. | උපන් දිනය | | |
| 4. | වයස | | |
| 5. | ආගම | | |
| 6. | ජාතිය | | |
| 7. | රැකියාව | | |
| 8. | මාසික ආදායම | | |
| 9. | ශාරීරික තත්ත්වය | | |
| 10. | මානසික තත්වය | | |
| 11. | අධ්‍යාපන තත්ත්වය | | |
| 12. | බරපතළ රෝග පිළිබඳ ඉතිහාසය ( ක්ෂය රෝගය, මීමැස්මොරය, පිළිකා, අංගභාගය ආදී බරපතල රෝග සහ මානසික රෝග වැළඳී තිබෙ නම් ඒ ගැන සඳහන් කරන්න.) | | |
| 13. | දුරකථන අංකය | | |
| 14. | Whatsapp අංකය | | |
| 15. | E-mail | | |

02. ඉල්ලුම්කරුවන්ගේ විවාහයේ තොරතුරු : ..........................................................................................

විවාහ වූ දිනය : ..........................................................................................

(විවාහ සහතික පත්‍රයේ ඡායා පිටපතක් අමුණන්න.)

CamScanner

CamScanner

03. ඉල්ලුම්කරුවන්ට දරුවන් සිටින්නේ නම් :

| | දරුවාගේ නම | උපන්දිනය / වයස | පාසල / රැකියාව |
|---|---|---|---|
| (අ) | .......................... | .......................... | .......................... |
| (ආ) | .......................... | .......................... | .......................... |

04. ළමයින් ලැබීමේ හැකියාව පිළිබඳ විශේෂඥ වෛද්‍ය උපදෙස් ලබා තිබේද? (තොරතුරු සඳහන් කරන්න.)

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

05. ඉල්ලුම්කරුවන් දැනට ස්ථිර පදිංචි නිවස පිළිබඳ ලුහුඬු විස්තර :

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

06. ඉල්ලුම්කරුවන්ගේ නිශ්චල සහ මූල්‍ය දේපළ පිළිබඳ විස්තර

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

07. ඉල්ලුම්කරුවන් අතර සම්බන්ධතාවය (ඔවුන්ගේ මානසික සබඳතාවය පිළිබඳ අවධානය යොමු කරන්න.)

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

08. දරුවෙක් හදා වඩා ගැනීමට ඉල්ලුම්කරුවන් කැමැත්ත දක්වන්නේ ඇයි?

(අ) ඉල්ලුම්කරුගේ අදහස:

..............................................................................................................................................

..............................................................................................................................................

(ආ) ඉල්ලුම්කාරියගේ අදහස :

..............................................................................................................................................

..............................................................................................................................................

09. හදවඩා ගැනීමේ ආඥාවක ඇතුළත් නිත්‍යානුකූල තත්වය සහ වෙනත් ගැටලු පිළිබඳව ඉල්ලුම්කරුවන් සමඟ සාකච්ඡා කර ඔවුන්ගේ වටහා ගැනීම පිළිබඳ සඳහන් කරන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

CamScanner

10. පරිවාස නිලධාරිගේ නිර්දේශය :

නිර්දේශ කරමි /නොකරමි

................................ ..................................... .................................

පරිවාස නිලධාරීන්ගේ නම අත්සන දිනය

11. ස්ථානභාර පරිවාස නිලධාරිගේ නිර්දේශය

නිර්දේශ කරමි /නොකරමි

................................ ..................................... .................................

අත්සන නිල මුද්‍රාව දිනය

12. ඉහත ස්ථානභාර පරිවාස නිලධාරී විසින් නිර්දේශිත තොරතුරු පරීක්ෂා කරන ලදි. බලපත්‍රයක් ලබාදීම නිර්දේශ කරමි.

....................................................

සහකාර කොමසාරිස් /
මූලස්ථාන පරිවාස නිලධාරි

13. බලපත්‍රයක් ලබාදීම අනුමත කරමි /නොකරමි.

....................................................

කොමසාරිස්

14. බලපත්‍ර අංකය: ..............................................................................................................

15. බලපත්‍ර ලබා දුන් දිනය: ..............................................................................................

විෂය භාර නිලධාරි

නම - ..........................................

අත්සන - ......................................

CamScanner

CamScanner